# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2116/50 – 2019 මාර්තු 28 වැනි බ්‍රහස්පතින්දා – 2019.03.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත 1 ඡේදයේ විස්තර කරනු ලබන පරවශතාවය, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි. එකී පරවශතාවය අත්කර ගනු ලබන්නේ කවර ඉඩමකින්ද යන්න 2 ඡේදයේ විස්තර වේ.

1. **පරවශ්‍යතාවේ විස්තරය.**– බූස්ටර් පොම්පාගාරයට ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක පරවශ්‍යතාවය අත්කර ගැනීම.

2. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 514ඒ වැලිකඩ බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වැලිකඩ ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක සීඕ/කේටීටී/2017/315 හා 2017.08.30 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් සහ ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අංක 1 – **ප්‍රමාණය: හෙක්. 0.0198 ක් පමණ**

උතුරට: රාජගිරිය පාරේ වරි. අංක 219/1, 225/2, 225/3, 225 සහ 223 දරන ඉඩම්; නැගෙනහිරට: රාජගිරිය පාරේ වරි. අංක 225/2, 225/3, 225 සහ 223 දරන ඉඩම් සහ රාජගිරිය පාර; දකුණට: රාජගිරිය පාරේ වරි. අංක 215 දරන ඉඩම; බටහිරට: රාජගිරිය පාරේ වරි. අංක 215 සහ 219/1 දරන ඉඩම්.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4/3/9/2017/ඩබ්ලිව්එස්/42.
2018 ඔක්තෝබර් මස 25 වැනි දින.
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

04 – 388


1A – G 29765 – 11 (2019/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*